බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය**

மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்

Western Provincial Education Department – Colombo Educational Zone Western Provincial Education Department – Colombo Educational Zone Western Provincial Educatio

# වර්ෂ අවසාන ඇගයීම - 2012

# வருட இறுதிக் கணிப்பீடு - 2012

| | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය I හා II පත්‍රය | පැය දෙකයි |
| தரம் 7 | சிங்கள மொழியும் இலக்கியமும் பகுதி I - II | இரண்டு மணித்தியாலங்கள் |

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටසේ අදහසට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. "මෙහෙම පැවැවොත් රටට මහ විනාශයක් වෙන එක <u>සිකුරු</u>" යි ගුරුතුමිය කීවා ය.
   i. අවිශ්වාස    ii. ස්ථිර    iii. හොඳ    iv. ළඟ

2. ආරච්චි මාමා <u>කඩිමුඩියේ</u> වත්ත පහළට දුවනු පෙනේ.
   i. කඩියෙක් වගේ    ii. හෙමින් සැරේ    iii. කලබලයෙන්    iv. භයියෙන්

- පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි ක්‍රියා පද කවර වර්ගයකට අයත් දැ'යි සඳහන් කරන්න.

3. අපි පාසලේදී රවුමක් <u>හැදී</u> ජන කවි කීවෙමු. ..............................................
4. ඔබේ සියලු පැතුම් <u>ඉටුවේවා</u>! ..............................................

- අංක 5 සිට 8 දක්වා ප්‍රශ්නවල ඇති නාම පදය කවර නාම පද වර්ගයකට අයත් දැයි වරහන් තුළින්තෝරා ලියන්න.

**(ස්ත්‍රීලිංග නාම, අනියමාර්ථ නාම, සර්ව නාම, පුරුෂලිංග නාම)**

5. ලිපිකරුවා - ..............................................
6. සෙබලියක - ..............................................
7. වැළහින්න - ..............................................
8. නුඹලා - ..............................................

- පහත සඳහන් වචනවල සාමාන්‍ය අදහස ලියන්න.

9. වෘක්ෂලතා - ..............................................
10. අනුවේදනීය - ..............................................

- **මෙම වාක්‍යයේ ඇතුළත් සඤ්ඤක අක්ෂර සහිත වචන දෙකක් හා මහාප්‍රාණ අක්ෂර සහිත වචන දෙකක් බැගින් ලියන්න.**

"කීර්ති කුමාරයා තැන් තැන්වල සැඟවෙමින් සේනා සන්නද්ධ කිරීම සඳහා ප්‍රමුඛත්වය දුන්නේය."

11. සඤ්ඤක - ........................................ ................................................

12. මහාප්‍රාණ- ........................................ ................................................

13. සැළලිහිණි සංදේශයේ එන මෙම කවියේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

"සැදි රත තඹර පෙළ රණතිසරුන් රුවැති
විදි දිය දහර ලෙළදෙන දිගු නරු පටැති
................................................................................
................................................................................"

- **පහත දැක්වෙන වැකියට සුදුසු විරාම ලකුණු යොදන්න.**

14. මොනවා මව පියා උදේ 8 10 විතර වනවිට පාසලට පැමිණිය යුතුද

................................................................................

- **නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය වරහන් තුළින් තෝරා ලියන්න.**

15. ........................................ පිරුළු භාෂාව අර්ථවත් කරයි. (ප්‍රස්ථාව, ප්‍රස්තාව)

16. බෝවෙන රෝග ........................................ කිරීම ඉතා දුෂ්කරය. (මර්දනය, මර්ධනය)

17. "ප්‍රාදේශීය ව්‍යවහාර" නමැති පාඩම උපුටා ගෙන ඇති මුල්කෘතිය සහ කර්තෘවරයා නම් කරන්න.

i. පොත - ........................................ ii. කර්තෘවරයා - ..............................

18. "අනුන්ගේ යහපත පිණිස කටයුතු කරන්නා" යන අදහස දෙන තනි පදය ලියන්න.

........................................................

- සුදුසු පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

19. චිත්‍ර ගුරුතුමිය ඉතා අලංකාර චිත්‍රයක් ........................................

20. අපේ පාසලේ කටයුතු වලට ........................................ ඉතා උනන්දුවෙන් සහභාගි වූවෙහි.

(ලකුණු 20 x 2 = 40)

## II පත්‍රය

- **පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) තෙවන වාරයේ දී ඔබ කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සකස් කළ පොත් පිංච ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) පොත් පිංචට සකස් කිරීම සඳහා ඔබ / ඔබේ කණ්ඩායම දායකත්වය ලබා දුන් ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 2)

(ආ) එය සකස් කිරීම සඳහා ගුරුතුමා හෝ ගුරුතුමිය දුන් උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 2)

(ඇ) එහි ඇතුළත් වූ අනු මාතෘකා හතරක් ලියන්න. (ලකුණු 4)

(ඈ) ජන කවි නිර්මාණය වීමට හේතු දෙකක් ලියන්න. (ලකුණු 2)

(ඉ) ඔබ එහි ඇතුළත් කරන ලද ගැල් කවියක් සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 4)

(ඊ) එම ක්‍රියාකාරකම තුළින් ඔබ ලද අත්දැකීම් දෙකක් ලියන්න. (ලකුණු 2)

(ලකුණු 16)

(02) පහත දැක්වෙන මාතෘකා අතුරින් එකක් තෝරා ගෙන වචන 150 කට නො අඩු රචනයක් ලියන්න.

(අ) ළමා ලෝකය සොඳුරු ය.

(ආ) පරිසරය අපේ වටිනා ම සම්පත යි.

(ඇ) සමගිය බලය වේ.

(ඈ) කියවන්නෝ ජයගන්නෝ.

(ඉ) අරුණෝදයේ කීචි බීචි හඬ අතරේ හිඳ....... (ලකුණු 14)

(03) ඔබේ සිංහල පෙළ පොතෙන් උපුටා ගත් පහත දැක්වෙන ප්‍රකාශයන් කරන ලද්දේ;
i. කවුරුන් විසින් ද? ii. කාහට ද? යන්න සඳහන් කරන්න.

(අ) "පන්සියයක් ගැල් තොප විසින් ගොඩ නැගූ කල්හි එකී එකී ගැලකට කහවණු දෙකක් කුලී කොට දහසක් දෙමි."

(ආ) ඔයා වැඩියෙන් ම ආදරේ කරන්නේ කාටද"?

(ඇ) "ඔය පුරසාරම් දොඩවන මිනිස්සු මට විශ්වාස කරන්න බැහැ".

(ඈ) "අලියෙක් ඉන්නවා කවුරුත් නිශ්ශබ්ද වන්න".

(ඉ) "මේකෙ තිබුණ සල්ලිවලින් එක සතයක් වත් මම ගත්තෙ නැහැ".

(ලකුණු 10)

(04) කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ග්‍රහලෝකාගාරය නැරඹීම සඳහා ඔබ විද්‍යාලයේ 7 වන ශ්‍රේණියේ සිසුන් සහභාගි කරවීමට අවශ්‍යව ඇත. තාරකා විද්‍යා සංගමයේ ලේකම් ඔබ යයි සිතා එය නැරඹීමට අවසර ඉල්ලා ග්‍රහලෝකාගාර අධ්‍යක්ෂතුමා වෙත යවනු ලබන රාජකාරී ලිපිය සකස් කරන්න.

(ලකුණු 10)

(05) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ක්‍රි.පූ. 600 - 500 කාලයට අයත් අනුරාධපුරයේ හමුවූ මැටි ලේඛනවල අක්ෂර ඉන්දු ආර්ය ප්‍රාකෘතවලට අයත් ය. මෙවැනි අක්ෂර දකුණු ඉන්දියාවේ ද, කොන්ඩුමනෙයි හා අරිකමෙඩු වලද හමුවී ඇත. එසේ හමු වූ කිසිදු අක්ෂරයක් ද්‍රවිඩ භාෂාවට අයත් නැත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ක්‍රි.පූ. 500 ට පෙර සිට ඉන්දු ආර්යයන් විසූ බවට මෙය වැදගත් සාක්ෂියකි.

ක්‍රි.පූ. 500 සිට අනුරාධපුරය ක්‍රමයෙන් නාගරික වූ බව සිතිය හැක. ක්‍රි.පූ. 3 වන ශත වර්ෂයේ අශෝක අධිරාජයාගේ කාලය වනවිට අනුරාධපුරය හෙක්ටයාර් 100 ක් පමණ දක්වා ව්‍යාප්ත ව ඇත. ඉන්දියා ශ්‍රී ලංකා අර්ධද්වීපයේ 10 වැනි විශාලතම නගරය වශයෙන් අනුරාධපුරය පැවත ඇත.

(අ) දකුණු ඉන්දියාවේ ස්ථාන ඉදකුකු නම් මෙහි දැක්වේ. ඒවා නම් කරන්න.
(ආ) ක්‍රි.පූ. 500 ට පෙර සිට මෙහි ජීවත් වූයේ කවුරුන් ද?
(ඇ) මැටි ලේඛනවල ලියා තිබුණේ මොනවා ද?
(ඈ) අනුරාධපුරය ක්‍රමයෙන් නාගරික වූයේ කවර වර්ෂයේ සිට ද?
(ඉ) හෙක්ටයාර් 100 පමණ දක්වා අනුරාධපුරය ව්‍යාප්ත ව තිබුණේ කවර අධිරාජයාගේ කාලයේ ද?

(ලකුණු 10)

(06) පහත සඳහන් පද්‍ය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. "එ දවස උදාස න
මහසත් තුමා සසොබ න
පබවත ගෙනෙන මෙ න
යමැ'යි සාගල පුරට සිතම් න

2. තෙද විකුම් පළ කොට
මෙමා සිත ඉහි සිදු කොට
එනතෙක් මෙ නුවරට
මෙ රජ සිරිසර හැම නියම කොට

3. මපිය රජ හට වත්
සොහොවුරු කුමරිඳුට වත්
මෙ රජ සිරි දුන හොත්
ගැනුම් උගහට වේය නැවතත්"

(අ) සාගල පුරයට යන්නේ කව් ද? කුමක් සඳහා ද? (ලකුණු 2)
(ආ) මහසත් යන්නෙහි තේරුම කුමක් ද? (ලකුණු 2)
(ඇ) "තෙද විකුම් පළ කොට
මෙමා සිත ඉහි සිදු කොට" යන්නෙහි තේරුම ලියන්න. (ලකුණු 2)
(ඈ) මෙම පද්‍ය පන්තියට අදාළ වන ජාතක කථාව කුමක් ද? (ලකුණු 2)
(ඉ) පියාට හෝ සොහොයුරාට රාජ්‍ය නොපවරන්නේ ඇයි? (ලකුණු 2)